# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1986 අංක 42 දරන
# රක්ෂණ පාලන (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 1986 දෙසැම්බර් මස 02 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1986 දෙසැම්බර් මස 05 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
**ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී**

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැකිය

මිල : රු. 1.80 යි. තැපැල් ගාස්තුව : රු. 1.15 යි.

# 1986 අංක 42 දරන රක්ෂණ පාලන (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1986 දෙසැම්බර් මස 02 වන දින.]

එල්. ඩී.—ඕ. 38/85

## 1962 අංක 25 දරන රක්ෂණ පාලන පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

1. මේ පනත 1986 අංක 42 දරන රක්ෂණ පාලන (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර, ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන යම් දිනයක එය ක්‍රියාත්මක විය යුතු ය.

*ලුහුඬු නාමය හා ක්‍රියාත්මක වන දිනය.*

2. මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන 1962 අංක 25 දරන රක්ෂණ පාලන පනතේ 3 වන වගන්තියේ (3) වන උපවගන්තිය ඉවත් කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

*1962 අංක 25 දරන පනතේ 3 වන වගන්තිය සංශෝධනය කිරීම.*

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 4 වන වගන්තිය මෙයින් ඉවත් කොට, ඒ වෙනුවට, පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ:—

*ප්‍රධාන ප්‍රඥප්තියේ 4 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.*

*"මේ පනත යටතේ ලියාපදිංචි කරනු ලැබූ තැනැත්තන් විසින් පමණක් රක්ෂණ ව්‍යාපාරය පවත්වාගෙන යා යුතු බව.*

4. මේ පනතේ විධිවිධානවලට යටත්ව, මේ වගන්තිය ක්‍රියාත්මක වන දින සිට හා ඊට පසුව, කිසිම තැනැත්තකු විසින්, ඒ තැනැත්තා, රක්ෂණ ව්‍යාපාරය පවත්වාගෙන යාමේ තනි කාර්යය සඳහා 1982 අංක 17 දරන සමාගම් පනත යටතේ ශ්‍රී ලංකාවේ සංස්ථාපිත සමාගමක් වන්නේ නම් සහ රක්ෂණ ව්‍යාපාරය ශ්‍රී ලංකාවේ පවත්වාගෙන යාම පිණිස බලය දීමක් වශයෙන් තත් කාලයේ මේ පනත යටතේ ලියාපදිංචි කරන ලද්දේ නම් මිස, කිසිම පංතියක රක්ෂණ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම ආරම්භ නො කළ යුතු ය.".

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තිය මෙයින් ඉවත් කොට, ඒ වෙනුවට, පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ:—

*ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.*

*"ලියාපදිංචි කිරීම සඳහා ඉල්ලුම් කරනු ලබන සමාගමක අවශ්‍යතා.*

5. (1) කිසිම සමාගමක්—

(අ) 1982 අංක 17 දරන සමාගම් පනත යටතේ ශ්‍රී ලංකාවේ සංස්ථාපිත සමාගමක් වන්නේ නම් සහ ඒ පනතේ 30 වන වගන්තියෙහි අර්ථ කථනය කර ඇති පරිදි පෞද්ගලික සමාගමක් නොවන්නේ නම්; සහ

2—ඒ 092809—7,250 (87/01)

(ආ) (i) ඒ සමාගම විසින් පවත්වාගෙන යනු ලැබීමට යෝජිත රක්ෂණ ව්‍යාපාරය තනිකරම ජීවිත ආරක්ෂණ ව්‍යාපාරයක් වන අවස්ථාවක, රුපියල් මිලියන විසි පහකට නො අඩු ගෙවා නිමි කොටස් ප්‍රාග්ධනයක් ද;

(ii) ඒ සමාගම විසින් පවත්වාගෙන යනු ලැබීමට යෝජිත රක්ෂණ ව්‍යාපාරය ජීවිත ආරක්ෂණ ව්‍යාපාරයක් නොවන්නා වූ යම් පන්තියක හෝ පන්තිවල රක්ෂණ ව්‍යාපාරයක් වන අවස්ථාවක, රුපියල් මිලියන පනහකට නො අඩු ගෙවා නිමි කොටස් ප්‍රාග්ධනයක් ද

තිබී සමාගමක් වන්නේ නම්;

මිස ශ්‍රී ලංකාවේ රක්ෂණ ව්‍යාපාරය පවත්වාගෙන යාම සඳහා බලය දීමක් ලෙස මේ පනත යටතේ ලියාපදිංචි නො කළ යුතු ය.

(2) (1) වන උපවගන්තියේ කුමක් සඳහන් වුවද 1982 අංක 17 දරන සමාගම් පනත යටතේ ශ්‍රී ලංකාවෙහි සංස්ථාගත කරන ලද්දා වූ ද, ඒ පනතේ 30 වන වගන්තියේ අර්ථකථනය කර ඇති පරිදි පුද්ගලික සමාගමක් නොවන්නා වූ ද යම් සමාගමක ගෙවා නිමි කොටස් ප්‍රාග්ධනය—

(අ) ඒ සමාගම විසින් පවත්වාගෙන යනු ලැබීමට යෝජිත රක්ෂණ ව්‍යාපාරය තනිකරම ජීවිත ආරක්ෂණ ව්‍යාපාරයක් වන අවස්ථාවක, රුපියල් මිලියන විසිපහකට අඩු වුවත් රුපියල් මිලියන පහළොවකට වැඩි වූ විට ද;

(ආ) ඒ සමාගම විසින් පවත්වාගෙන යනු ලැබීමට යෝජිත රක්ෂණ ව්‍යාපාරය ජීවිත ආරක්ෂණ ව්‍යාපාරයක් නොවන්නා වූ යම් පන්තියක හෝ පන්තිවල රක්ෂණ ව්‍යාපාරයක් වන අවස්ථාවක, රුපියල් මිලියන පණහකට අඩු වුවත් රුපියල් මිලියන විසිපහකට වැඩි වූ විට ද

ඒ සමාගම විසින් එකී ගෙවා නිමි කොටස් ප්‍රාග්ධනයේ අගය මෙන් තුන් ගුණයකට වැඩි වූ මුදල් ප්‍රමාණයක් සඳහා යම් රක්ෂණ ඔප්පුවක් නිකුත් නොකිරීමේ කොන්දේසියට යටත්ව, රක්ෂණ ව්‍යාපාරය පවත්වාගෙන යාම පිණිස බලය දෙන ලද ලෙස මේ පනත යටතේ ලියාපදිංචි කරනු ලැබිය හැකි ය.

5. ප්‍රධාන ප්‍රඥප්තියේ 6 වන වගන්තිය මෙහි පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:— ප්‍රධාන ප්‍රඥප්තියේ 6 වන වගන්තිය සංශෝධනය කිරීම.

(අ) ඒ වගන්තියේ (1) වන උපවගන්තියෙහි—

(i) (අ) ඡේදයේ "රක්ෂක විසින් ලියවිල්ලකින් කරනු ලබන ප්‍රකාශයක් ද ඊට යා කළ යුතු ය; තවද" යන වචන වෙනුවට "රක්ෂක විසින් ලියවිල්ලකින් කරනු ලබන ප්‍රකාශයක්;" යන වචන ආදේශ කිරීමෙන්;

(ii) ඒ වගන්තියේ (ආ) ඡේදය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන ඡේද ආදේශ කිරීමෙන්:—

"(ආ) සමාගමේ සාංගමික සංස්ථා පත්‍රයේ සහ ව්‍යවස්ථාවලියේ සහතික පිටපතක්;

(ඇ) සමාගමේ සංස්ථාපන සහතිකයේ සහතික පිටපතක්;

(ඈ) සමාගම් රෙජිස්ට්‍රාර්වරයා විසින් නිකුත් කරන ලද, ව්‍යාපාරය ආරම්භ කිරීම සඳහා වූ සහතිකයේ සහතික පිටපතක්;

(ඉ) (i) සමාගමේ කොටස්කරුවන්ට;

(ii) සමාගමේ අධ්‍යක්ෂවරුන්ට;

(iii) 19අ සහ 34අ වගන්තිවල සඳහන් නිලධරයන්ට

අදාළ නියමිත විස්තර දැක්වෙන ප්‍රකාශයක්;

(ඊ) සමාගම විසින් පවත්වාගෙන යනු ලැබීමට යෝජිත රක්ෂණ ව්‍යාපාරයේ පන්තිය හෝ පන්ති දැක්වෙන ප්‍රකාශයක් සහ

(උ) සමාගමේ ගෙවා නිමි කොටස් ප්‍රාග්ධනයේ මුදල දැක්වෙන ප්‍රකාශයක්

ඊට යා කළ යුතු ය.";

(ආ) ඒ වගන්තියේ (2) වන උපවගන්තිය ඉවත් කිරීමෙන්; සහ

(ඇ) ඒ වගන්තියේ (4) වන උපවගන්තිය වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන්:—

"(4) මේ වගන්තිය යටතේ ලියාපදිංචි කිරීම සඳහා වූ සෑම ඉල්ලුම් පත්‍රයකට ම—

(අ) නියමිත ගාස්තුව; සහ

(ආ) පාලකවරයාගේ අනුමතය සඳහා ඉදිරිපත් කරනු ලබන, අවුරුදු තුනක කාලයක් සම්බන්ධයෙන් වූ වැඩ පිළිවෙලක් හෝ ව්‍යාපාර සැලැස්මක්

යා කළ යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 7 වන වගන්තිය සංශෝධනය කිරීම.

6. ප්‍රධාන ප්‍රඥප්තියේ 7 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

(අ) ඒ වගන්තියේ (1) වන උපවගන්තිය ඉවත් කොට, ඒ වෙනුවට, පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් :—

"(1) මේ පනත යටතේ ලියාපදිංචි කිරීම සඳහා ඉල්ලුම් පත්‍රයක් ඉදිරිපත් කරන යම් සමාගමක් විසින්, 5 වන හා 6 වන වගන්තිවල විධිවිධාන සපුරා ඇති බවට පාලකවරයා සෑහීමට පත්වූ අවස්ථාවක, ශ්‍රී ලංකාවේ රක්ෂණ ව්‍යාපාරය පවත්වා ගෙන යාම සඳහා බලය දෙන ලද තැනැත්තකු වශයෙන් පාලකවරයා විසින් ඒ සමාගම ලියාපදිංචි කළ යුතු අතර, ඒ සමාගම විසින් පවත්වාගෙන යාමට බලය දෙන ලද රක්ෂණ ව්‍යාපාරයේ පන්තිය හෝ පන්ති නිශ්චිතව දැක්විය යුතු ය.".

(ආ) ඒ වගන්තියේ (2) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපවගන්තිය ඇතුළත් කිරීමෙන් :—

"(3) මේ වගන්තියේ (2) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද සෑම ලියාපදිංචි කිරීමේ සහතිකයක් ම එක් අවුරුද්දක කාලය සඳහා වලංගු විය යුතු වන අතර, මේ පනතේ විධිවිධානවලට යටත්ව, රුපියල් පන් දාහක ගාස්තුවක් ගෙවා වාර්ෂිකව අලුත් කළ හැකි ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 8 වන වගන්තිය සංශෝධනය කිරීම.

7. ප්‍රධාන ප්‍රඥප්තියේ 8 වන වගන්තියේ "6 වන වගන්තියේ (1) වන උපවගන්තිය හෝ (2) වන උපවගන්තියේ" යන වචන සහ අංක වෙනුවට "6 වන වගන්තියේ (1) වන උපවගන්තියේ" යන වචන හා අංක ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 9 වන වගන්තිය ඉවත් කිරීම.

8. ප්‍රධාන ප්‍රඥප්තියේ 9 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 10 වන වගන්තිය සංශෝධනය කිරීම.

9. ප්‍රධාන ප්‍රඥප්තියේ 10 වන වගන්තියේ (3) වන උපවගන්තියේ (අ) ඡේදයෙහි "රුපියල් දෙසිය පනහක ගාස්තුවක්" යන වචන වෙනුවට "නියමිත ගාස්තුව" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 16 වන වගන්තිය සංශෝධනය කිරීම.

10. ප්‍රධාන ප්‍රඥප්තියේ 16 වන වගන්තියේ "සෑම ලාංකික රක්ෂකයකු විසින් ම" යන්නෙහි සිට "තබා පවත්වාගෙන යා යුතු ය" යන්න දක්වා වූ සියලුම වචන වෙනුවට "සෑම රක්ෂකයකු විසින් ම, ඒ රක්ෂකයා විසින් ගනු දෙනු කළ සියලු රක්ෂණ ව්‍යාපාර සම්බන්ධයෙන් පහත දැක්වෙන දේ තබා පවත්වා ගෙන යා යුතු ය" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

**11.** ප්‍රධාන ප්‍රඥප්තියේ 19 වන වගන්තියේ (1) වන හා (2) වන උපවගන්ති ඉවත් කොට, ඒ වෙනුවට, පහත දැක්වෙන උපවගන්ති ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :— **ප්‍රධාන ප්‍රඥප්තියේ 19 වන වගන්තිය සංශෝධනය කිරීම.**

"(1) (අ) රක්ෂකයකු විසින්, පාලකවරයාගේ අනුමතය ඇතිව හා පාලකවරයා විසින් තත් කාර්යය සඳහා නිශ්චිතව දක්විය හැකි යම් නියමයන්ට හා කොන්දේසිවලට යටත්ව, ඒ රක්ෂකයා විසින් ක්‍රියාත්මක කරනු ලැබූ හෝ නිකුත් කරනු ලැබූ යම් ගිවිසුමක් හෝ රක්ෂණ ඔප්පුවක් හේතුකොට ගෙන උද්ගත වන්නා වූ යම් වගකීමක් ශ්‍රී ලංකාවෙහි හෝ ඉන් පිටත වෙනත් යම් රක්ෂකයකු වෙත ප්‍රතිරක්ෂණය කළ හැකි ය; තව ද

(ආ) සෑම රක්ෂකයකු විසින් ම, තමා විසින් ක්‍රියාත්මක කරනු ලැබූ හෝ නිකුත් කරනු ලැබූ ගිනි හා මුහුදු රක්ෂණ ගිවිසුම් සහ ඔප්පු යටතේ තමාට ලැබෙන දළ වාර්ෂික රක්ෂණ වාර මුදලින් සියයට පහළොවක් ප්‍රතිරක්ෂණය කිරීමක් වශයෙන් ජාතික රක්ෂණ සංස්ථාව වෙත පාවා දිය යුතු ය;

(2) ප්‍රති රක්ෂණය පවත්වා ගෙන යනු ලබන යම් රක්ෂකයකු වෙත ඉදිරිපත් කරනු ලබන යම් හිමිකම් පෑමක් සපුරාලීම සඳහා අවශ්‍ය අරමුදල් ඒ රක්ෂකයා වෙත ඇති බව සහතික කරනු පිණිස අවශ්‍ය යයි පාලකවරයා විසින් සලකනු ලැබිය හැකි යම් තොරතුරක් ඉදිරිපත් කරන ලෙස පාලකවරයා විසින් ලියවිල්ලකින් වූ දැන්වීමක් මගින් ඒ රක්ෂකයාට නියම කළ හැකි ය. තවද, ඒ දැන්වීමෙහි නියමයන්ට අනුකූලව ක්‍රියා කිරීම ඒ රක්ෂකයාගේ කාර්යය විය යුතුය.

**12.** ප්‍රධාන ප්‍රඥප්තියේ 19 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන වගන්ති මෙයින් ඇතුළත් කරනු ලබන අතර, ඒ වගන්ති ප්‍රධාන ප්‍රඥප්තියේ 19අ, 19ආ, 19ඇ හා 19ඈ වගන්ති වශයෙන් බලාත්මක විය යුතු ය :— **ප්‍රධාන ප්‍රඥප්තියේ 19අ, 19ආ, 19ඇ, හා 19ඈ අලුත් වගන්ති ඇතුළත් කිරීම.**

"රක්ෂණ ව්‍යාපාරය පවත්වා ගෙන යන රක්ෂකයාගේ කාර්ය මණ්ඩලය.

**19අ.** ජීවිත ආරක්ෂණ ව්‍යාපාරය නොවන රක්ෂණ ව්‍යාපාරයක් පවත්වා ගෙන යනු ලබන සෑම රක්ෂකයකු විසින් ම—

(අ) වරලත් රක්ෂණ ආයතනයේ ආශ්‍රිත සාංගමිකයකුගේ සුදුසුකම් හෝ ඒ හා සමාන සුදුසුකම් ඇත්තා වූ; හෝ

(ආ) වරලත් රක්ෂණ ආයතනයේ සාංගමිකයකුගේ සුදුසුකම් හෝ ඒ හා සමාන සුදුසුකම් ඇත්තා වූ;

සහ යටත් පිරිසෙයින් සුදුසුකම් ලැබීමෙන් පසු අවුරුදු පහක පළපුරුද්ද සහිත කළමනාකරණ මට්ටමේ යටත් පිරිසෙයින් එක් තැනැත්තකු සේවයේ නියුක්ත කළ යුතු ය.

රක්ෂකයා විසින් යම් රක්ෂණ බ්‍රෝකර් සමාගමක කොටස් ඇරීම තහනම් බව.

19ආ. කිසිම රක්ෂකයකු විසින් හෝ රක්ෂකයකුගේ පාලක හෝ පාලිත සමාගමක් විසින් රක්ෂණ බ්‍රෝකර් ව්‍යාපාරය පවත්වාගෙන යනු ලබන යම් සමාගමක කොටස් කිසිවක් ඇරීම නොකළ යුතු ය.

රක්ෂකයා විසින් රක්ෂණ ව්‍යාපාරය භාරගත යුත්තේ කවර තැනැත්තන් ගෙන් ද යන වග.

19ඇ. තමා විසින් ජීවිත ආරක්ෂණය නොවන

(අ) රක්ෂණ ගිවිසුමක් හෝ ඔප්පුවක් ක්‍රියාත්මක කරනු ලැබූ හෝ නිකුත් කරනු ලැබූ රක්ෂිතයකුගෙන් ;

(ආ) 'ප්‍රතිරක්ෂණය සම්බන්ධයෙන් වෙනත් රක්ෂකයකුගෙන් ;

(ඇ) රක්ෂණ අනුයෝජිතයකුගෙන් ; හෝ

(ඈ) මේ පනත යටතේ ලියාපදිංචි කරනු ලැබූ රක්ෂණ බ්‍රෝකර්වරයකුගෙන්

හැරුණු විට, යම් රක්ෂණ ව්‍යාපාරයක් භාර නොගත යුතු ය.

සාමාන්‍ය රක්ෂණ ඔප්පු යටතේ රක්ෂකයාගේ වගකීම.

19ඈ. තමා විසින් ජීවිත ආරක්ෂණය නොවන රක්ෂණ ව්‍යාපාරයක් සම්බන්ධයෙන් ක්‍රියාත්මක කරන ලද හෝ නිකුත් කරන ලද යම් රක්ෂණ ගිවිසුමක් හෝ ඔප්පුවක් යටතේ ලැබිය යුතු යම් මුදලක් ගෙවීමට —

(අ) එම මුදල ගෙවිය යුතු වන දිනට ලැබිය යුතු පූර්ණ වාරික ගෙවා තිබේ නම් ; හෝ

(ආ) එම මුදල ගෙවිය යුතු වන දිනට රක්ෂිතයා විසින් ඒ වාරික ගෙවීම සම්බන්ධයෙන් බැංකු සුරැකුමක් ඉදිරිපත් කර ඇත්තේ නම් සහ රක්ෂිතයා විසින් ඒ වාරික ඒ දින සිට දින තිහක් ඇතුළත ගෙවනු ලබන්නේ නම්

මිස රක්ෂකයකු යටත් නොවන්නේ ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 21 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

13. ප්‍රධාන ප්‍රඥප්තියේ 21 වන වගන්තිය මෙයින් ඉවත් කොට, ඒ වෙනුවට, පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ :—

"රක්ෂණ වාරික අනුප්‍රමාණ නියම කිරීම සඳහා පාලකවරයා සතු බලය.

21. (1) රක්ෂකයන් විසින් නිකුත් කරනු ලබන රක්ෂණ ඔප්පු සම්බන්ධයෙන් රක්ෂකයන් විසින් අයකළ යුතු උපරිම හෝ අවම රක්ෂණ වාරික අනුප්‍රමාණ හෝ ඒ දෙකම පාලකවරයා විසින් කලින් කල නියම කොට දැනුම් දිය හැකි ය.

(2) කිසිම රක්ෂකයකු විසින්, යම් පන්තියක රක්ෂණය සම්බන්ධයෙන්, තමා විසින් ක්‍රියාත්මක කරන ලද හෝ නිකුත් කරන ලද රක්ෂණ ගිවිසුමක් හෝ ඔප්පුවක් යටතේ—

(අ) (1) වන උපවගන්තිය යටතේ ඒ පන්තියේ රක්ෂණය සඳහා නියම කරන ලද උපරිම අනුප්‍රමාණයට වඩා ඉහළ ; හෝ

(ආ) (1) වන උපවගන්තිය යටතේ ඒ පන්තියේ රක්ෂණය සඳහා නියම කරන ලද අවම අනුප්‍රමාණයට වඩා පහළ

මුදලක් වාරික වශයෙන් භාර නොගත යුතු ය.".

14. ප්‍රධාන ප්‍රඥප්තියේ 21 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය ඇතුළත් කරනු ලබන අතර, එය ප්‍රඥප්තියේ 21අ වගන්තිය වශයෙන් බලාත්මක විය යුතු ය :— ප්‍රධාන ප්‍රඥප්තියේ 21අ අලුත් වගන්තිය ඇතුළත් කිරීම.

"රක්ෂණ ඔප්පු ආකෘති.

21අ. (1) යම් රක්ෂකයකු විසින් නිකුත් කරනු ලබන රක්ෂණ ඔප්පු ආකෘතිවල පිටපත් ඉදිරිපත් කරන ලෙස පාලකවරයා විසින් ලියවිල්ලකින් වූ දැන්වීමක් මගින් ඒ රක්ෂකයාට නියම කළ හැකි අතර, ඒ දැන්වීමේ නියමයන් සපුරාලීම ඒ රක්ෂකයාගේ කාර්ය වන්නේ ය.

(2) ඉහත කී ඔප්පු ආකෘතිවලින් ආවරණය වන රක්ෂණ ගිවිසුමේ නියමයන් සාධාරණ සහ යුක්ති සහගත වීමේ අවශ්‍යතාව සැලකිල්ලට ගෙන මේ වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ තමා වෙත ඉදිරිපත් කරන ලද යම් රක්ෂණ ඔප්පු ආකෘතියක් සම්බන්ධයෙන් පාලකවරයා විසින් සංශෝධන යෝජනා කරනු ලැබිය හැකි අතර, ඒ සංශෝධන ක්‍රියාත්මක කිරීම එවැනි ආකෘති ඉදිරිපත් කරන රක්ෂකයාගේ කාර්ය වන්නේ ය.".

15. ප්‍රධාන ප්‍රඥප්තියේ 29 වන වගන්තියෙහි "එවැනි රක්ෂකයකු සමාගමක් වන්නේ නම්" යන යෙදුම අත්හැරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ. ප්‍රධාන ප්‍රඥප්තියේ 29 වන වගන්තිය සංශෝධනය කිරීම.

16. ප්‍රධාන ප්‍රඥප්තියේ 33 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 33 වන වගන්තිය සංශෝධනය කිරීම.

"(අ) ඒ වගන්තියේ (1) වන උපවගන්තියෙහි "එවැනි රක්ෂකයකු සමාගමක් වන අවස්ථාවක" යන යෙදුම අත්හැරීමෙන් ; සහ

(ආ) ඒ වගන්තියේ (2) වන උපවගන්තියෙහි "එවැනි රක්ෂකයකු සමාගමක් වන අවස්ථාවක" යන යෙදුම අත් හැරීමෙන්.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 34අ හා 34ආ යන අලුත් වගන්ති ඇතුළත් කිරීම.

**17.** ප්‍රධාන ප්‍රඥප්තියේ 34 වන වගන්තියට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් වගන්ති ඇතුළත් කරනු ලබන අතර, ඒ වගන්ති ප්‍රධාන ප්‍රඥප්තියේ 34අ හා 34ආ වගන්ති වශයෙන් බලාත්මක විය යුතු ය:—

" ජීවිත ආරක්ෂණ ව්‍යාපාරය පවත්වාගෙන යන රක්ෂකයකුගේ කාර්ය මණ්ඩලය.

34අ. ජීවිත ආරක්ෂණ ව්‍යාපාරය පවත්වාගෙන යනු ලබන සෑම රක්ෂකයකු විසින් ම—

(අ) යටත් පිරිසෙයින් ජීවිත රක්ෂණය පිළිබඳ කළමනාකරණ මට්ටමේ අවුරුදු දහයකට අධික පළපුරුද්දක් ඇති එක් තැනැත්තකු සේවයේ යෙදීම;

(ආ) එවැනි ව්‍යාපාරයක මුදල් තත්වය පිළිබඳ කරුණු සොයා බැලීම සඳහා ජීවන සංඛ්‍යා නිලධරයකු සේවයේ යෙදීම හෝ ස්ථිර පදනමක් මත බඳවා ගැනීම

කළ යුතු ය.

සංචිත අරමුදල.

34ආ. (1) (4) වන උපවගන්තියට යටත්ව, ජීවිත ආරක්ෂණ ව්‍යාපාරය පවත්වාගෙන යනු ලබන සෑම රක්ෂකයකු විසින් ම, ප්‍රාග්ධනය ඇතුළුව ස්වකීය සංචිත අරමුදල්වලින් සියයට පනහක් රජයේ සුරැකුම්වල සහ ශේෂය අනුමත ආයෝජනවල ආයෝජනය කළ යුතු ය.

(2) (4) වන උපවගන්තියට යටත්ව, ජීවිත ආරක්ෂණ ව්‍යාපාරය නොවන රක්ෂණ ව්‍යාපාරය පවත්වාගෙන යනු ලබන සෑම රක්ෂකයකු විසින් ම, ප්‍රාග්ධනය ඇතුළුව ස්වකීය සංචිත අරමුදල්වලින් සියයට තිහක් රජයේ සුරැකුම්වල සහ ශේෂය අනුමත ආයෝජනවල ආයෝජනය කළ යුතු ය.

(3) මේ වගන්තියේ කාර්යය සඳහා 'අනුමත ආයෝජනය' යන්නෙන් —

(අ) අනුමත සුරැකුම්;

(ආ) වාණිජ බැංකුවල තැන්පතු;

(ඇ) 1975 අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනත යටතේ පිහිටුවනු ලැබූ රාජ්‍ය උකස් බැංකුවේ තැන්පතු හා ආයෝජන හෝ 401 වන අධිකාරය වූ ජාතික නිවාස පනත යටතේ පිහිටුවන ලද සීමාසහිත ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථාවේ තැන්පතු සහ ආයෝජන;

(ඈ) නිල ලැයිස්තුගත සමාගම්වල ආයෝජන අදහස් වේ.

(4) කිසිම රක්ෂකයකු විසින්—

(අ) පාලකවරයාගේ අවසරය ඇතුව මිස, ස්වකීය සංචිත අරමුදල්වලින් සියයට පහකට වැඩි ප්‍රමාණයක් (3) වන උපවගන්තියේ (අ) හෝ (ආ) ඡේදවල සඳහන් යම් අනුමත ආයෝජනයක ආයෝජනය කිරීම; හෝ

(ආ) ස්වකීය සංචිත අරමුදල්වලින් සියයට පහකට වැඩි ප්‍රමාණයක්, රක්ෂකයාගේ පාලක හෝ පාලිත සමාගමහි කොටස් ඇත්තා වූ හෝ රක්ෂකයාගේ පාලක හෝ පාලිත සමාගමක් වන්නා වූ බැංකුවක් වශයෙන් වූ වාණිජ බැංකුවක තැන්පතුවක් වශයෙන් ආයෝජනය කිරීම

නොකළ යුතු ය.".

18. ප්‍රධාන ප්‍රඥප්තියේ 35 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:— ප්‍රධාන ප්‍රඥප්තියේ 35 වන වගන්තිය සංශෝධනය කිරීම.

(අ) ඒ වගන්තියේ (1) වන උපවගන්තියෙහි "ශ්‍රී ලාංකික රක්ෂකයකු විසින් ම" යන්නෙහි සිට "සම්පාදනය කළ යුතුය" යන්න දක්වා වූ සියලුම වචන වෙනුවට, "සෑම රක්ෂකයකු විසින්ම ගනුදෙනු කරන ලද සියලු රක්ෂණ ව්‍යාපාර සම්බන්ධයෙන්, එවැනි රක්ෂකයකු විසින් එක් එක් ලිත් වර්ෂය අවසානයේ දී ඒ වර්ෂය සම්බන්ධයෙන් පහත සඳහන් දේ සම්පාදනය කළ යුතු ය" යන වචන ආදේශ කිරීමෙන්; සහ

(ආ) ඒ වගන්තියේ (2) වන උපවගන්තිය ඉවත් කොට, ඒ වෙනුවට, පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන්:—

"(2) සමාගමක් සම්බන්ධයෙන් වන අවස්ථාවක, 1982 අංක 17 දරන සමාගම් පනතින් නියමිත නිලධරයන් හා තැනැත්තන් විසින් ද, වෙනත් යම් අවස්ථාවක රක්ෂකයා විසින් ද (1) වන උපවගන්තියේ සඳහන් ගිණුම් හා ප්‍රකාශන අත්සන් කළ යුතු අතර, එවැනි ගිණුම් හා ප්‍රකාශනවලට අදාළ කාලය තුළ ව්‍යාපාරයේ කළමනාකාරිත්වය භාර එක් එක් තැනැත්තන්ගේ නම් හා විස්තර අඩංගු ප්‍රකාශනයක් ද, තත් කාලයේ දී ව්‍යාපාරයේ කටයුතු සම්බන්ධයෙන් එවැනි තැනැත්තන් විසින් දෙන ලද වාර්තාවක් ද ඊට ඇමිණිය යුතු ය".

19. ප්‍රධාන ප්‍රඥප්තියේ 37 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:— ප්‍රධාන ප්‍රඥප්තියේ 37 වන වගන්තිය සංශෝධනය කිරීම.

(අ) ඒ වගන්තියේ (3) වන උපවගන්තියෙහි "රක්ෂකයා විසින් හෝ රක්ෂකයාගේ බලයලත් නිලධරයා විසින්, හෝ රක්ෂකයා සමාගමක් වන අවස්ථාවක" යන වචන අතහැර දැමීමෙන්;

(ආ) ඒ වගන්තියේ (6) වන උපවගන්තිය ඉවත් කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියේ 38 වන වගන්තිය සංශෝධනය කිරීම.

**20.** ප්‍රධාන ප්‍රඥප්තියේ 38 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(අ) ඒ වගන්තියේ (1) වන උපවගන්තියෙහි අතුරු වගන්තිය ඉවත් කොට, ඒ වෙනුවට, පහත දැක්වෙන අතුරු වගන්තිය ආදේශ කිරීමෙන් :—

"එසේ වුවද පාලකවරයා විසින්, වාර වාර්තා ඉදිරිපත් කිරීම සඳහා ඉඩ දී ඇති කාලය මාස තුනක් නොඉක්මවන්නා වූ කාලයකින් දීර්ඝ කළ හැකි ය": තවද

(ආ) ඒ වගන්තියේ (2) වන උපවගන්තිය ඉවත් කොට, ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් :—

"(2) (1) වන උපවගන්තිය යටතේ ඉදිරිපත් කරන ලද පිටපත් හතරෙන් එකක් අධ්‍යක්ෂවරයන් විසින් අත්සන් කළ යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 40 වන වගන්තිය සංශෝධනය කිරීම.

**21.** ප්‍රධාන ප්‍රඥප්තියේ 40 වන වගන්තියේ "රක්ෂකයා සමාගමක් නම් අවස්ථාවක" යන වචන අතහැර, ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 54 වන වගන්තිය සංශෝධනය කිරීම.

**22.** ප්‍රධාන ප්‍රඥප්තියේ 54 වන වගන්තියේ (3) වන උපවගන්තිය ඉවත් කොට, ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ—

"(3) රක්ෂකයාගේ සමාගමේ සංස්ථා පත්‍රයේ හෝ ව්‍යවස්ථාවල කවරක් සඳහන් වුව ද, ඒ ගැන නොසලකා, (2) වන උපවගන්තිය යටතේ තමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර පාලකවරයා විසින් කරන ලද යම් ක්‍රියාවක් බලාත්මක විය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 58 වන වගන්තිය සංශෝධනය කිරීම.

**23.** ප්‍රධාන ප්‍රඥප්තියේ 58 වන වගන්තිය මෙයින් ඉවත් කොට, ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ :—

"දේපළ හෝ ලේඛන පරිපාලක වරයාට ඉදිරිපත් නොකොට හැර ගැනීම සම්බන්ධව දඬුවම්.

58. කළමනාකරණය පරිපාලකවරයා වෙත පැවරී ඇති රක්ෂකයාගේ ව්‍යාපාරයට අදාළ වන්නා වූ තමා භාරයේ ඇති යම් ගිණුම් පොත්, ලේඛන හෝ ලියවිලි කිසිවක් පරිපාලකවරයා වෙත භාර දීමට රක්ෂකයකුගේ යම් අධ්‍යක්ෂවරයකු විසින් පැහැර හැරිය හොත් හෝ එවැනි රක්ෂකයකුගේ යම් දේපළක් තබා ගතහොත් ඔහු වරදකට වරද කරු වන අතර, මාස හයක් නොඉක්මවන කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයකට බන්ධනාගාරගත කිරීමකට හෝ රුපියල් දහසක් නොඉක්මවන්නා වූ දඩයකට හෝ එවැනි බන්ධනාගාරගත කිරීම සහ දඩය යන දෙකට ම යටත් විය යුතු ය."

ප්‍රධාන ප්‍රඥප්තියේ 61 වන වගන්තිය සංශෝධනය කිරීම.

24. ප්‍රධාන ප්‍රඥප්තියේ 61 වන වගන්තියෙහි (1) වන උප වගන්තිය ඉවත් කොට, ඒ වෙනුවට, පහත දැක්වෙන උප වගන්තිය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

"(1) රක්ෂකයකු විසින් පවත්වාගෙන යනු ලබන රක්ෂණ ව්‍යාපාරයට අදාළ වත්කම්වල වටිනාකම, මේ පනතේ 12 වන වගන්තිය යටතේ රක්ෂණ සමාගමක් විසින් තත්කාලයේ පවත්වාගෙන යා යුතු ලෙස නියම වී තිබෙන තැන්පත් මුදලින් හෝ පෙරාතුවම වූ මුදල් වර්ෂය සඳහා වූ සාමාන්‍ය වාරික ආදායමින් දහයෙන් එකක් යන මේ මුදල් ප්‍රමාණ දෙකින් වඩා වැඩි මුදලින් ඒ ව්‍යාපාරයට අදාළ බැරකම්වල මුදල් ප්‍රමාණය නොඉක්මවන්නේ නම්, 1982 අංක 17 දරන සමාගම් පනතේ 254 වන වගන්තියේ කාර්ය සඳහා, ඔහුට තම ණය ගෙවීම කළ නොහැකි ලෙස සැලකිය යුතු අතර, මේ පනතේ විධිවිධාන ඒ අනුව අදාළ විය යුතු ය.

ප්‍රධාන ප්‍රඥප්තියේ 70 වන වගන්තිය සංශෝධනය කිරීම.

25. ප්‍රධාන ප්‍රඥප්තියේ 70 වන වගන්තියේ (අ) ඡේදයෙහි "ඒ තැනැත්තා පුද්ගලයකු වන්නේ නම්" යන්නෙහි සිට ඒ වගන්තියේ අවසානය දක්වා වූ සියලුම වචන වෙනුවට, "එදින හෝ ඊට පසුව එම තැනැත්තා විසින් දරනු ලැබූ වෙනත් යම් වත්කම්වලට සහ එම තැනැත්තා සමාගමක් වන අවස්ථාවක, ඒ සමාගමේ එක් එක් අධ්‍යක්ෂවරයා විසින් දරනු ලැබූ වත්කම්වලට විරුද්ධව නඩු කටයුතු පවත්වා ඒ රක්ෂණ ඔප්පු යටතේ හිඟව පවත්නා යම් මුදලක් අයකර ගැනීමට සෑම රක්ෂණ ඔප්පු හිමියකුට ම අයිතිය ඇත්තේ ය." යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 73 වන වගන්තිය සංශෝධනය කිරීම.

26. ප්‍රධාන ප්‍රඥප්තියේ 73 වන වගන්තියේ (2) වන උප වගන්තිය ඉවත් කොට, ඒ වෙනුවට, පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

"(2) රක්ෂකයකු විසින් මේ පනත යටතේ වූ වරදක් සිදු කරනු ලැබූ අවස්ථාවක, රක්ෂකයාගේ සෑම අධ්‍යක්ෂවරයකු විසින්ම, වරද සිදු කරන ලද්දේ තම දැනුම හෝ අනුමතය ඇතිව නොවන බවත්, එම වරද සිදු කිරීම වළක්වනු පිණිස තමා විසින් සාධාරණ පියවර සියල්ලම ගන්නා ලද බවත් ඔප්පු කරන්නේ නම් මිස, ඔහු ද එම වරදට වරදකරු විය යුතු වන අතර, එම දඬුවමට යටත් විය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියට VIIIඅ අලුත් කොටස ඇතුළත් කිරීම.

27. ප්‍රධාන ප්‍රඥප්තියේ VIII වන කොටසට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් කොටස මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය VIIIඅ කොටස වශයෙන් බලාත්මක විය යුතුය :—

"VIIIඅ කොටස

රක්ෂණ බ්‍රෝකර්වරුන් ලියාපදිංචි කිරීම

"ලියාපදිංචි නොකොට රක්ෂණ බ්‍රෝකර්වරය තාගේ ව්‍යාපාරය පවත්වාගෙන යාම තහනම් කිරීම.

75අ. (1) රක්ෂණ බ්‍රෝකර්වරයකුගේ ව්‍යාපාරය පවත්වාගෙන යාම සඳහා බලය දෙනු ලැබීමක් ලෙස මේ කොටස යටතේ යම් තැනැත්තකු ලියාපදිංචි කර ඇත්තේ නම් මිස, ඒ තැනැත්තා විසින් එවැනි ව්‍යාපාරයක් පවත්වාගෙන යාම ආරම්භ නොකළ යුතු ය.

(2) යම් තැනැත්තකු—

(අ) බ්‍රෝකර්වරයකු වශයෙන් ලියාපදිංචි කරනු ලැබීම සඳහා තමා විසින් ඉල්ලුම් කරන ලද්දේ යම් පන්තියක රක්ෂණ ව්‍යාපාරය සම්බන්ධයෙන් ද ඒ පන්තියේ රක්ෂණ ව්‍යාපාරය පිළිබඳව, යටත් පිරිසෙයින්, අවුරුදු පහළොවක පළපුරුද්දක් ඔහුට තිබෙන්නේ නම්, හෝ ලියා පදිංචි කරනු ලැබීම සඳහා තමා විසින් ඉල්ලුම් කරන ලද්දේ යම් පන්තියක රක්ෂණ ව්‍යාපාරය සම්බන්ධයෙන් ද ඒ පන්තියේ රක්ෂණ ව්‍යාපාරය පිළිබඳව සුදුසුකම් ලැබීමෙන් පසු අවුරුදු පහක පළපුරුද්ද සහිතව වරලත් රක්ෂණ ආයතනයේ ආශ්‍රිත සාංගමිකයකුගේ සුදුසුකම් හෝ ඒ හා සමාන සුදුසුකම් ඇත්තේ නම්, හෝ ලියා පදිංචි කරනු ලැබීම සඳහා තමා විසින් ඉල්ලුම් කරන ලද්දේ යම් පන්තියක රක්ෂණ ව්‍යාපාරයක් සම්බන්ධයෙන් ද ඒ පන්තියේ රක්ෂණ ව්‍යාපාරය පිළිබඳව, යටත් පිරිසෙයින්, අවුරුදු පහක පළපුරුද්ද සහිතව වරලත් රක්ෂණ ආයතනයේ සාංගමිකයකුගේ සුදුසුකම් හෝ ඒ හා සමාන සුදුසුකම් ඇත්තේ නම්;

(ආ) එවැනි තැනැත්තකු සමාගමක් වන අවස්ථාවක, සමාගම විසින් ලියා පදිංචි කරනු ලැබීම සඳහා ඉල්ලුම් කරන ලද්දේ යම් පන්තියක රක්ෂණ ව්‍යාපාරයක් සම්බන්ධයෙන් ද, ඒ රක්ෂණ ව්‍යාපාරය පිළිබඳව, යටත් පිරිසෙයින්, අවුරුදු පහළොවක පළපුරුද්ද ඇත්තා වූ හෝ රක්ෂණ බ්‍රෝකර්වරයකු වශයෙන් ලියා පදිංචි කරනු ලැබීම සඳහා ඉල්ලුම් කරන ලද්දේ යම් පන්තියක රක්ෂණ ව්‍යාපාරයක් සම්බන්ධයෙන් ද, ඒ පන්තියේ රක්ෂණ ව්‍යාපාරය පිළිබඳව යටත් පිරිසෙයින්, සුදුසුකම් ලැබීමෙන් පසු, අවුරුදු පහක පළපුරුද්ද සහිතව වරලත් රක්ෂණ ආයතනයේ ආශ්‍රිත සාංගමිකයකුගේ සුදුසුකම් හෝ ඒ හා සමාන සුදුසුකම් ඇත්තා වූ හෝ ලියා පදිංචි කරනු ලැබීම සඳහා සමාගම විසින් ඉල්ලුම් කරන ලද්දේ යම් පන්තියක රක්ෂණ ව්‍යාපාරයක් සම්බන්ධයෙන් ද ඒ පන්තියේ රක්ෂණ ව්‍යාපාරය පිළිබඳව සුදුසුකම්

ලැබීමෙන් පසු, අවුරුදු පහක පළපුරුද්ද සහිතව වරලත් රක්ෂණ ආයතනයේ සාංගමිකයකුගේ සුදුසුකම් හෝ ඒ හා සමාන සුදුසුකම් ඇත්තා වූ එක් තැනැත්තකු, යටත් පිරිසෙයින්, සමාගම විසින් ස්ථිර තත්වයෙන් සේවයේ යොදවන්නේ නම්

මිස, මේ පනත යටතේ රක්ෂණ බ්‍රෝකර්වරයකු වශයෙන් ලියා පදිංචි නොකළ යුතු ය.

(3) කිසිම තැනැත්තකු, ඒ තැනැත්තා විසින් රුපියල් එක් දහසක ගාස්තුවක් පාලකවරයා වෙත ගෙවනු ලැබීම මත හැර, මේ කොටස යටතේ රක්ෂණ බ්‍රෝකර්වරයකු වශයෙන් ලියා පදිංචි නොකළ යුතු ය.

(4) රක්ෂණ බ්‍රෝකර්වරයකු වශයෙන් මේ කොටස යටතේ ලියා පදිංචි කරනු ලැබූ සෑම තැනැත්තකු ම, හත්වන උපලේඛනයේ දැක්වෙන නියමයන්ට හා කොන්දේසිවලට යටත් විය යුතු ය.

(5) මේ කොටස යටතේ රක්ෂණ බ්‍රෝකර්වරයකු වශයෙන් යම් තැනැත්තකු ලියා පදිංචි කර සිටි අවස්ථාවක දී එම තැනැත්තා විසින් හත්වන උපලේඛනයේ දැක්වෙන නියමයන් හා කොන්දේසි අතුරෙන් යම් නියමයක් හෝ කොන්දේසියක් උල්ලංඝනය කරමින් ක්‍රියා කළහොත් පාලකවරයා විසින්, නියමයක් මගින්, ඒ නියමයේ දැක්වෙන යම් කාලයක් සඳහා ඒ ලියා පදිංචි කිරීම අත්හිටුවීම හෝ අවලංගු කිරීම කළ හැකි ය.

ලියා පදිංචි කිරීමේ සහතිකය නිකුත් කිරීම.

75ආ. මේ කොටස යටතේ යම් තැනැත්තකු රක්ෂණ බ්‍රෝකර්වරයකු වශයෙන් ලියාපදිංචි කරනු ලැබූ විට පාලකවරයා විසින් ඒ තැනැත්තා වෙත ලියා පදිංචි කිරීමේ සහතිකයක් නිකුත් කළ යුතු ය.

ලියා පදිංචි කිරීමේ සහතිකය අලුත් කිරීම.

75ඇ. (1) මේ කොටස යටතේ නිකුත් කරනු ලබන ලියා පදිංචි කිරීමේ සහතිකය—

(අ) අවුරුද්දක කාලයක් සඳහා වලංගු විය යුතු ය; තව ද

(ආ) රුපියල් පන් සියයක ගාස්තුවක් ගෙවනු ලැබූ විට වාර්ෂිකව එය අලුත් කළ යුතු ය.

(2) මේ කොටස යටතේ නිකුත් කරනු ලැබූ ලියා පදිංචි කිරීමේ සහතිකය මගින්, ජීවිත ආරක්ෂණ ව්‍යාපාරය හෝ ජීවිත ආරක්ෂණ ව්‍යාපාරය නොවන වෙනත් යම් පන්තියක හෝ පන්තිවල රක්ෂණ ව්‍යාපාර සම්බන්ධයෙන් රක්ෂණ

බ්‍රෝකර්වරයකු වශයෙන් ව්‍යාපාරය පවත්වාගෙන යාම සඳහා තත් සහතිකය දරන්නාට බලය දිය යුතු ය.

ජීවිත ආරක්ෂණ ව්‍යාපාරය සහ ජීවිත ආරක්ෂණ ව්‍යාපාරය නොවන වෙනත් යම් පන්තියක හෝ පන්තිවල රක්ෂණ (ව්‍යාපාර) සම්බන්ධයෙන් රක්ෂණ බ්‍රෝකර්වරයකු වශයෙන් ව්‍යාපාරය පවත්වාගෙන යාමට අදහස් කරන සෑම බ්‍රෝකර්වරයකු විසින් ම ලියාපදිංචි කිරීමේ සහතික දෙකක් සඳහා ඉල්ලුම් කළ යුතු ය.

ලියාපදිංචි කිරීමේ සහතිකය පැවරිය නොහැකි බව.

75ඈ. (අ) ලියාපදිංචි කිරීමේ සහතිකයක් වෙනත් යම් තැනැත්තකු වෙත පැවරිය නොහැකි වන අතර, ඒ අනුව එවැනි යම් පැවරීමක් ශූන්‍ය හා බලරහිත වන්නේ ය;

(ආ) ලියාපදිංචි කිරීමේ සහතිකයක් වෙනත් යම් තැනැත්තකුගේ ප්‍රයෝජනය සඳහා පාවිච්චි නොකළ යුතු වන්නේ ය.

ලියාපදිංචි කිරීම අත්හිටුවීම හෝ අවලංගු කිරීම.

75ඉ. (1) ලියාපදිංචි කිරීමේ සහතිකයක් නිකුත් කරනු ලබන්නේ යම් තැනැත්තකු වෙත ද ඒ තැනැත්තා—

(අ) නිදහස නොලත් බංකොලොත්කරුවකු වීම හෝ වස්තු භංගත්වයට පත්වීම; හෝ

(ආ) චරිත දූෂණය සම්බන්ධ යම් වරදකට වරදකරු කරනු ලැබීම; හෝ

(ඇ) බලාත්මකව පවත්නා යම් නීතියක් යටතේ, සිහි විකල වූවකු බවට තීරණය කරනු ලැබීම හෝ ප්‍රකාශ කරනු ලැබීම; හෝ

(ඈ) පාලකවරයා විසින් දෙනු ලබන උපදෙස් දිගටම පිළි නොපැදීම

හේතුකොටගෙන ඒ ව්‍යාපාරය පවත්වාගෙන යාමට ඔහු නුසුදුසු බව පාලකවරයාගේ මතය වන්නේ නම්, ඔහු විසින්, විෂම-චාරයේ ස්වභාවය සලකා, නියෝගයක් මගින්, ඒ නියෝගයේ නිශ්චිතව දැක්වෙන යම් කාලයක් සඳහා, එවැනි සහතිකයක් අත්හිටුවීම හෝ අවලංගු කිරීම කළ හැකි ය.

(2) රක්ෂණ බ්‍රෝකර්වරයකු වශයෙන් ව්‍යාපාරය පවත්වාගෙන යනු ලබන තැනැත්තකු වෙත යැවෙන ලියවිල්ලකින් වූ දැන්වීමක් මගින්, ඔහුට විරුද්ධව (1) වන උපවගන්තිය යටතේ වූ නියම යක් නොකළ යුත්තේ මන්දැයි ඒ දැන්වීමේ නිශ්චිතව දක්විය හැකි කාලයක් ඇතුළත හේතු දක්වන ලෙස ඔහුට දැනුම් දීමෙන් පසුව මිස සහ ඒ කාලය ඇතුළත හේතු දක්වීමට ඔහු අසමත් වීම හෝ ප්‍රමාණවත් හේතු නොදැක්වීම මත මිස එවැනි නියමයක් නොකළ යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ නියමයක් නිකුත් කරන ලද්දේ යම් රක්ෂණ බ්‍රෝකර්වරයකු වශයෙන් ව්‍යාපාරය පවත්වාගෙන යනු ලබන යම් තැනැත්තකුට විරුද්ධව ද, ඒ තැනැත්තා විසින්, ඒ නියමය කරනු ලැබූ පාලකවරයා විසින් හෝ පාලකවරයා වෙනුවට ඒ නියමය ඒ තැනැත්තා වෙත දැනුම් දුන් දිනට පසුව දින දහයක් ඉකුත් වීමට පෙර, අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත ලියවිල්ලකින් වූ අභියාචනයක් ඉදිරිපත් කළ හැකි අතර, ලේකම්වරයා විසින්, තමා වෙත ඉදිරිපත් කරන ලද යම් අභියාචනයක් සම්බන්ධයෙන් කටයුතු කිරීමේ දී ඒ අභියාචනය ඉදිරිපත් කරන ලද්දේ යම් නියමයකට විරුද්ධව ද ඒ නියමය ස්ථිර කිරීම, වෙනස් කිරීම හෝ නිෂ්ප්‍රභ කිරීම කළ හැකි ය.

(4) රක්ෂණ බ්‍රෝකර්වරයකු වශයෙන් ව්‍යාපාරය පවත්වාගෙන යාම පිණිස යම් තැනැත්තකු වෙත නිකුත් කරනු ලැබූ ලියාපදිංචි කිරීමේ සහතිකයක් අත්හිටුවමින් හෝ අවලංගු කරමින් (1) වන උප වගන්තිය යටතේ කරනු ලබන නියමයක්, ඒ නියමයට විරුද්ධව ලේකම්වරයා වෙත අභියාචන යක් ඉදිරිපත් කරනු ලැබ තිබුණ ද ඒ ගැන නොතකා, පාලකවරයා විසින් හෝ පාලකවරයා වෙනුවට ඒ නියමය ඒ තැනැත්තා වෙත දැනුම් දුන් දින සිට බලාත්මක විය යුතු අතර, දිගටම බලාත්මකව පැවතිය යුතු ය.

(5) මේ වගන්තියේ පෙරාතුව වූ විධිවිධාන යටතේ යම් තැනැත්තකු වෙත දිය යුතු නියමිත යම් දැන්වීමක් හෝ දැනුම් දීමට නියමිත යම් නියම යක් ඒ දැන්වීම හෝ නියමය, ඔහුගේ සාමාන්‍ය ව්‍යාපාරික හෝ නේවාසික ස්ථානය වෙත ලියා

පදිංචි කළ තැපැලෙන් ලිපියක් මගින් යවනු ලැබූ දිනට පසුව ගණන් ගනු ලබන දින දෙකක කාලයක් අවසන් වීමෙන් පසුව ඒ දැන්වීම හෝ නියමය ඔහු වෙත භාර දුන්නා සේ හෝ දැනුම් දුන්නා සේ සැලකිය යුතු ය.

රක්ෂණ බ්‍රෝකර්වරයන්ට අදාළ කාරණා සම්බන්ධයෙන් වූ නියෝග.

75ඊ. පහත දැක්වෙන සියලුම කාරණා හෝ ඒ කාරණා අතුරෙන් යම් කාරණයක් සඳහා සහ ඒ සම්බන්ධයෙන් මේ පනත යටතේ නියෝග සාදනු ලැබිය හැකි ය :—

(අ) රක්ෂණ බ්‍රෝකර්වරයකු වශයෙන් ලියාපදිංචි කිරීම සඳහා වූ ඉල්ලුම් පත්‍ර සෑදීම සහ සුදුස්සක් කොට බැහැර කිරීම කළ හැකි ආකාරය හා පිළිවෙළ ;

(ආ) මේ පනතේ විධිවිධාන හෝ ඒ යටතේ සාදන ලද යම් නියෝග පිළිපදිනු ලැබීම සහතික කිරීම සඳහා අවශ්‍ය විය හැකි, පරිදි රක්ෂණ බ්‍රෝකර්වරයකු විසින් පවත්වාගෙන යනු ලබන ව්‍යාපාරයට සම්බන්ධ යම් විස්තර ප්‍රකාශ සහ ප්‍රකාශන සැපයීම ;

(ඇ) ජීවිත ආරක්ෂණ ව්‍යාපාරය සහ ජීවිත ආරක්ෂණ ව්‍යාපාරයක් නොවන වෙනත් යම් පන්තියක රක්ෂණ ව්‍යාපාරයක් සම්බන්ධයෙන් රක්ෂණ බ්‍රෝකර්වරයකු විසින් අය කරනු ලැබිය යුතු උපරිම කොමිස් මුදල.

රක්ෂණ බ්‍රෝකර්වරයකුට විධාන නිකුත් කිරීමේ බලය.

75උ. රක්ෂණ බ්‍රෝකර්වරයකු වශයෙන් ව්‍යාපාරය පවත්වා ගෙන යනු ලබන යම් තැනැත්තකු විසින් මේ පනතේ විධිවිධාන හෝ ඒ යටතේ සාදනු ලබන යම් නියෝග පිළිපදිනු ලැබීම සහතික කිරීමේ කාර්යය සඳහා අවශ්‍ය යයි තමා විසින් කල්පනා කරනු ලබන යම් ලිඛිත විධානයන් කිසිවක් පාලකවරයා විසින් ඒ තැනැත්තා වෙත නිකුත් කළ හැකි අතර, එවැනි යම් විධානයක් නිකුත් කරන ලද්දේ යම් තැනැත්තකු වෙතද ඒ තැනැත්තා විසින්, ඒවායේ නිශ්චිතව දැක්වෙන යම් කාලයක් ඇතුළත ඒ විධානයන් සපුරාලිය යුතු ය.

වාර්තා පවත්වාගෙන යාම.

75ඌ. රක්ෂණ බ්‍රෝකර්වරයකු වශයෙන් ව්‍යාපාරය පවත්වාගෙන යන සෑම තැනැත්තකු විසින් ම, නියමිත යම් වාර්තාව පවත්වාගෙන යා යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 76 වන වගන්තිය සංශෝධනය කිරීම.

**28.** ප්‍රධාන ප්‍රඥප්තියේ 76 වන වගන්තියේ.—

(අ) (අ) ඡේදයෙහි "තැනැත්තකු" යන වචනය වෙනුවට "රක්ෂණ වැඩ සම්බන්ධයෙන් ප්‍රවීණ තැනැත්තකු" යන වචන ; සහ

(ආ) (ආ) ඡේදයෙහි "තැනැත්තකු" යන වචනය වෙනුවට "රක්ෂණ වැඩ සම්බන්ධයෙන් ප්‍රවීණ තැනැත්තකු" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියෙහි 76 අ සහ 76 ආ සහ අලුත් වගන්ති ඇතුළත් කිරීම.

**29.** ප්‍රධාන ප්‍රඥප්තියේ 76 වන වගන්තියට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් වගන්ති මෙයින් ඇතුළත් කරනු ලබන අතර, ඒ වගන්ති ප්‍රධාන ප්‍රඥප්තියේ 76අ හා 76ආ යන වගන්ති වශයෙන් බලාත්මක විය යුතු ය :—

"රක්ෂණ උපදේශක කමිටුව

76අ. (1) රක්ෂණ ක්ෂේත්‍රයේ විශේෂඥීය වූ තැනැත්තන්ගෙන් සහ තැනැත්තන් අතුරෙන් අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන තැනැත්තන් හතර දෙනකුගෙන් සමන්විත වන්නා වූ (මෙහි මින්මතු "උපදේශක කමිටුව" යනුවෙන් සඳහන් කරනු ලබන) රක්ෂණ උපදේශක කමිටුව යනුවෙන් හඳුන්වනු ලබන කමිටුවක් විය යුතු ය.

(2) අමාත්‍යවරයා විසින් කමිටුවේ සාමාජිකයන්ගෙන් කෙනකු කමිටුවේ සභාපතිවරයා වශයෙන් පත් කළ යුතු ය.

(3) කමිටුවේ සෑම සාමාජිකයකු විසින්ම, මරණය, ඉල්ලා අස්වීම හෝ ඉවත් කිරීම හේතු කොටගෙන, කලින් ධුරය හිස් කළහොත් මිස අවුරුදු තුනක කාලයක් ධුරය දැරිය යුතු ය. කාලය ගෙවී යාම අනුව ධුරය හිස් කරන කමිටුවේ යම් සාමාජිකයෙක් යළි පත් කරනු ලැබීම සඳහා හිමිකම් ලබන්නේ ය.

(4) කමිටුවේ කවර වූ හෝ සාමාජිකයකු විසින්, අමාත්‍යවරයා වෙත ආමන්ත්‍රිත ලිපියක් මගින් සාමාජික ධුරයෙන් ඉල්ලා අස් විය හැකි ය.

(5) අමාත්‍යවරයා විසින් කමිටුවේ යම් සාමාජිකයකු හේතු නොදක්වාම, ධුරයෙන් ඉවත් කළ හැකි ය.

(6) කමිටුවේ යම් රැස්වීමක් සඳහා වූ ගණපූරණය සාමාජිකයන් දෙදෙනකු විය යුතු ය.

උපදේශක කමිටුවේ කාර්ය.

76ආ. මේ පනත පරිපාලනය කිරීම හා ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් සහ පාලක විසින් උපදේශක කමිටුවේ උපදෙස් සඳහා ඒ කමිටුව වෙත යොමු කරනු ලබන මේ පනතට අදාළ යම් කාරණයක් සම්බන්ධයෙන් පාලක වෙත උපදෙස් දීම රක්ෂණ උපදේශක කමිටුවේ කාර්යය විය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 77 වන වගන්තිය සංශෝධනය කිරීම.

**30.** 1967 අංක 9 දරන පනතින් සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 77 වන වගන්තියේ, (1) වන උපවගන්තිය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ :—

"(1) යම් රක්ෂකයකු වෙත භාර දිය යුතු බවට මේ පනත මගින් හෝ මේ පනත යටතේ නියමිත හෝ බලය දෙන ලද යම් දැන්වීමක් හෝ වෙනත් ලේඛනයක්, 1982 අංක 17 දරන සමාගම් පනතේ ඇතුළත් තත් කාර්යය සඳහා වූ විධිවිධාන ප්‍රකාර, රක්ෂකයගේ යම් අධ්‍යක්ෂවරයකු හෝ කළමනාකාරවරයකු හෝ නිලධරයකු වෙත භාර දිය යුතු අතර, එසේ භාර දෙනු ලැබුවහොත්, මේ පනතේ කාර්ය සඳහා නිසි පරිදි භාර දෙනු ලැබුවා සේ සැලකිය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 84 වන වගන්තිය සංශෝධනය කිරීම.

**31.** ප්‍රධාන ප්‍රඥප්තියේ 84 වන වගන්තියේ (1) වන උපවගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(අ) "අනුමත සුරැකුම්" යන අර්ථ කථනය වෙනුවට පහත දැක්වෙන අර්ථ කථනය ආදේශ කිරීමෙන් :—

"අනුමත සුරැකුම්" යන්නෙන්—

(අ) ආණ්ඩුවේ සුරැකුම්,

(ආ) ආණ්ඩුව සහතික කළ සුරැකුම්,

(ඇ) පළාත් පාලන ආයතන සුරැකුම්,

(ඈ) තැපැල් කාර්යාලීය ඉතිරි කිරීමේ බැංකු සහතික,

(ඉ) ලංකා සංවර්ධන මුදල් සංස්ථාවේ කොටස්,

(ඊ) යම් අනුමත ව්‍යාපෘතියක ආයෝජන, සහ

(උ) ශ්‍රී ලංකා ආණ්ඩුව සහ පුද්ගලික තැනැත්තන් එක්ව සහභාගි වන්නා වූ යම් ආයතනයක සාමාන්‍ය කොටස්, වරණීය කොටස් හා සෑණ පත්‍ර

අදහස් වේ.

(ආ) පිළිවෙළින් "ලංකා රක්ෂක", "විදේශීය රක්ෂණ සමාගම" සහ "විදේශීය රක්ෂක" යන අර්ථ කථන අහෝසි කිරීමෙන්.

(ඇ) "ආණ්ඩුවේ සුරැකුම්" යන අර්ථ කථනයේ "අදහස් වන නමුදු ව්‍යවහාර මුදල් නෝට්ටුවක් ඊට ඇතුළත් නොවේ" යන වචන වෙනුවට "අදහස් වන අතර, 1971 අංක 30 දරන ජාතික ඉතිරිකිරීමේ බැංකු පනතේ පිහිටුවනු ලැබූ ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ තැන්පතු ඊට ඇතුළත් වන සේ සැලකිය යුතු නමුදු, ව්‍යවහාර මුදල් නෝට්ටුවක් ඊට ඇතුළත් නොවේ" යන වචන ආදේශ කිරීමෙන්.

(ඈ) "රක්ෂක" යන අර්ථ කථනය වෙනුවට පහත දැක්වෙන අර්ථ කථනය ආදේශ කිරීමෙන් :—

"රක්ෂක" යන්නෙන් ශ්‍රී ලංකාවේ තත් කාලයේ බලාත්මක වන යම් නීතියක් යටතේ සංස්ථාපනය කරනු ලැබුවා වූ ද, රක්ෂණ ව්‍යාපාරය පවත්වාගෙන යාම සඳහා බලය දෙන ලද ලෙස තත් කාලයේ මේ පනත යටතේ ලියාපදිංචි කරනු ලැබුවා වූ ද යම් සමාගමක් අදහස් වන අතර, නියමිත දිනට වගකීම නොගෙවා හෝ නිදහස් නොකොට පවත්නා රක්ෂණ ව්‍යාපාරයක්, නියමිත දිනට කලින් පවත්වාගෙන යන ලද්දා වූ හෝ ඒ සම්බන්ධයෙන් ගනු දෙනු කරන ලද්දා වූ යම් පුද්ගලයකු, යම් සංස්ථාවක් හෝ සංස්ථාගත කරනු නොලැබූ මණ්ඩලයක් ඊට ඇතුළත් වන සේ සැලකිය යුතු ය ;

(ඉ) "කළමනාකාරවරයා" යන අර්ථ කථනයට ඉක්බිතිවම පහත දැක්වෙන අර්ථ කථනය ඇතුළත් කිරීමෙන් :—

"ජාතික රක්ෂණ සංස්ථාව" යන්නෙන්, 1979 අංක 22 දරන රක්ෂණ (විශේෂ විධිවිධාන) පනතේ 3 වන වගන්තිය යටතේ කරන ලද නියමය මගින් පිහිටුවනු ලැබූ ජාතික රක්ෂණ සංස්ථාව අදහස් වේ.".

(ඊ) "නියමිත" යන අර්ථ කථනයට ඉක්බිතිව ම පහත දැක්වෙන අර්ථ කථනය ඇතුළත් කිරීමෙන් :—

"ප්‍රතිරක්ෂණය" යන්නෙන්, යම් රක්ෂණ ගිවිසුමක් හෝ ඔප්පුවක් යටතේ දරන ලද රක්ෂකයකුගේ වගකීම, වෙනත් රක්ෂකයකු හෝ රක්ෂකයන් වෙත පැවරීම අදහස් වේ.".

32. ප්‍රධාන ප්‍රඥප්තියේ හත්වන උපලේඛනය මෙයින් ඉවත් කොට, ඒ වෙනුවට පහත දැක්වෙන උපලේඛනය ආදේශ කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 7 වන උපලේඛනය සංශෝධනය කිරීම.

### හත්වන උපලේඛනය (75අ වගන්තිය)

1. වෘත්තීය නොසැලකිලිමත්කමට එරෙහිව පාලක විසින් දක්වනු ලබන මුදලක රක්ෂණ ඔප්පුවක් රක්ෂණ බ්‍රෝකර්වරයා විසින් දැරිය යුතු ය.

2. පාලකවරයාගේ මතය අනුව, රක්ෂණ බ්‍රෝකර්වරයකු ලෙස ඔහුගේ කාර්ය සහ යම් කර්තව්‍යයකට හෝ වෘත්තියකට අදාළව රක්ෂණ බ්‍රෝකර්වරයකුට ඇති කාර්ය අතර සම්බන්ධතා පිළිබඳව යම් ගැටීමක් ඇතිවිය හැකි යම් කර්තව්‍යයක් හෝ වෘත්තියක නිරතවීම සඳහා රක්ෂණ බ්‍රෝකර්වරයකුට හිමිකම් නැත්තේ ය.

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත්වල සහ නීතිවල වාර්ෂික දායක මිල (දේශීය) රු. 150 යි. (විදේශීය) රු. 200 යි. කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවීමෙන් පසුව එළඹෙන ඒ ඒ වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.